**මැණික් හා ස්වර්ණාභරණ පර්යේෂණ හා අභ්‍යාස ආයතනය -2010**

## 01. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මතය

මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු සහ පැහැදිලි කිරීම් අනුව, මැණික් සහ ස්වර්ණාභරණ පර්යේෂණ හා අභ්‍යාස ආයතනයේ 2010 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බවත්, මෙම වාර්තාවේ 1.2 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් මූල්‍ය ප්‍රකාශන වලට වන බලපෑම හැර 2010 දෙසැම්බර් 31 දිනට මැණික් සහ ස්වර්ණාභරණ පර්යේෂණ හා අභ්‍යාස ආයතනයේ ක්‍රියාකාරීත්වය පිළිබඳ තත්ත්වය සහ එදිනෙන් අවසන වර්ෂය සඳහා එහි මෙහෙයුම් කටයුතුවල මූල්‍ය ප්‍රතිඵල හා මුදල් ප්‍රවාහය සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති වලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඉදිරිපත් කර ඇති බවත් මා දරන්නා වූ මතය වේ.

### 1.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම්

#### 1.2.1 ගිණුම්කරණ අඩුපාඩු

පහත අඩුපාඩු නිරීක්ෂණය විය.

(අ) මෝටර් රථයක් ප්‍රත්‍යාගණනය කර එහි වටිනාකම ගිණුම්වලට ඇතුළත් කර තිබුණු අතර වත්කමේ පොත් අගය හා ක්ෂය වෙන්කිරීම අදාළ ගිණුම්වලින් ඉවත් නොකිරීම නිසා වත්කම් ගිණුම රු.1,500,000 කින් හා ක්ෂය වෙන් කිරීමේ ගිණුම රු.1,500,000 කින් වැඩියෙන් දක්වා තිබුණි.

(ආ) ශ ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 18 අනුව වත්කම් මිලදීගත් දින සිට ක්ෂය වෙන්කිරීම් සිදුකළ යුතු බව දක්වා ඇතත් ආයතනය විසින් වත්කම් මිලදීගත් වර්ෂය සඳහා ක්ෂය කිරීම් සිදුකර නොතිබුණි. ආයතනයේ මෙතෙක් අඛණ්ඩව අනුගමනය කළ ප්‍රතිපත්තිය වනුයේ මිලදී ගත් වසරේ ක්ෂය නොකර ඊළඟ එළඹෙන වර්ෂයේ සිට ක්ෂය කිරීම බව 2011 ජුනි 06 දින සභාපතිවරයා විසින් ඉදිරිපත් කරන ලද පිළිතුරුවල දක්වා තිබුණි.

(ඇ) පාරිතෝෂිත වෙන්කිරීම් ගිණුමෙහි රු.13,405 ක් අඩුවෙන් ප්‍රතිපාදනය කර තිබුණි.

#### 1.2.2 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) 2002 වර්ෂයේ සිට ආයතනයේ මූල්‍ය ප්‍රකාශනවල ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරියෙන් ලැබිය යුතු භාණ්ඩාගාර බිල්පත් පොලී ආදායම ලෙස දක්වා තිබුණු රු.4,527,422 ක් වසර 8 ක කාලයක් ගත වී ඇතත් නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

(ආ) 2008 වර්ෂයේදී බිරගම මධ්‍යස්ථානය වෙනුවෙන ලබාදී තිබු අත්තිකාරම් මුදලින් රු.24,119 ක් නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

1.2.3 **<u>නීති, රීති හා රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම</u>**

පහත සඳහන් නීති,රීති යනාදියට අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

| **<u>නීති, රීති හා රෙගුලාසි යනාදියට යොමුව</u>** | **<u>අනුකූල නොවීම</u>** |
|---|---|
| (අ) 2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය | |
| (i) 4.2.2. ජේදය | සෑම මාසයකට වරක්ම අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමක් පවත්වා ආයතනයේ කාර්ය සාධනය සමාලෝචනයට භාජනය කළයුතු වුවත් ආයතනය විසින් 2010 වර්ෂය සඳහා අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් 04 ක් පමණක් පවත්වා තිබුණි. |
| (ii) 6.5.3 වගන්තිය | මුදල් වර්ෂය අවසන් වී මාස 5 ක් ඇතුළත වාර්ෂික වාර්තාව පාර්ලිමේන්තුවේ සභාගත කළයුතු වුවත් 2009 වර්ෂයේ වාර්ෂික වාර්තාව 2011 අප්‍රේල් මස වන විටත් සභාගත කර නොතිබුණි. |
| (iii ) 5.1.3 වගන්තිය | අවම වශයෙන් මුදල් වර්ෂය ආරම්භ වීමට දින 15 කට පෙර අධ්‍යක්ෂ මණ්ඩලය අනුමත කළ සංයුක්ත සැලැස්මේ යාවත්කාලීන පිටපත්, රේඛීය අමාත්‍යාංශය, රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව, මහාභාණ්ඩාගාරය සහ විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවත් අධ්‍යක්ෂ මණ්ඩලය වෙත ඉදිරිපත් කර තිබුණේ 2010 සැප්තැම්බර් 24 දින වු අතර අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කර තිබුණේ 2011 පෙබරවාරි 08 දිනදීය. අධ්‍යක්ෂ මණ්ඩලය විසුරුවාහැර තිබීම ප්‍රමාදයට හේතු වු බව සභාපති දන්වා තිබුණි. |
| (iv) 8.3.2 වගන්තිය | සභාපතිවරයාට මාසික දීමනාව පමණක් හිමිකම ඇති බව දන්වා තිබියදීත් මාසික දීමනාවට අමතරව මාසිකව රු.25,000 බැගින් ඉකුත් වර්ෂයේ රු.165,000 ක් සහ සමාලෝචිත වර්ෂයේදී රු.300,000 ක් ලබාගෙන තිබුණි. |
| (ආ) 2008 ජුලි 28 දිනැති අංක පීඊඩී/50 දරන රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තු චක්‍රලේඛයේ 02 ජේදය | (i) සේවා ස්ථානයෙන් බැහැරව යෙදෙන රාජකාරි සඳහා පමණක් අතිරේක ඉන්ධන වියදම් ඉල්ලීම් කළයුතු වුවත් ආයතනයේ අධ්‍යක්ෂවරයා විසින් පාඨමාලාවකට සහභාගිවීම සඳහා සහ වෙනත් පෞද්ගලික ගමන් වෙනුවෙන් සහ සාමාන්‍ය රාජකාරි කටයුතු සඳහා රු.100,900 වටිනා අතිරේක ඉන්ධන ලබාගෙන තිබුණි. |

(ii) සේවා ස්ථානයෙන් බැහැරව යෙදෙන විශේෂ රාජකාර් සඳහා පමණක් අතිරේක ඉන්ධන සඳහා අමාත්‍යාංශ ලේකම්ගේ පූර්ව අනුමැතිය ලබාගත යුතු බව දැක්වෙතත් ආයතනයේ සභාපතිවරයා විසින් 2010 පෙබරවාරි සිට දෙසැම්බර් 31 දක්වා ලබාගත් රු.548,516 ක අතිරේක ඉන්ධන වියදම සඳහා අමාත්‍යාංශ ලේකම්ගේ අනුමැතිය ලබාගෙන නොතිබුණි. සමාලෝචිත වර්ෂයේදී ඔහුට හිමි ඉන්ධන සීමාව යටතේ රු.240,000 ක්ද අතිරේක ඉන්ධන සඳහා රු.600,000 ක්ද ලබාගෙන තිබුණි. මෙම අතිරේක ඉන්ධන වැය දැරීමේදී සාමාන්‍ය රාජකාර් සඳහාද අතිරේක ඉන්ධන වියදම් ලබාගෙන තිබුණි.

## 02. මූල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය

### 2.1 මූල්‍ය සමාලෝචනය

#### 2.1.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2010 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ආයතනයේ වැඩ කටයුතුවල මූල්‍ය ප්‍රතිඵලය රු.778,960 ක ඌනතාවයක් වූ අතර ඊට එරෙහිව 2009 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා අතිරික්තය රු.644,548 ක් විය. මේ අනුව ඉකුත් වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලය හා සැසඳීමේදී සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයේ රු.1,423,508 ක පිරිහීමක් පෙන්නුම් කෙරුණි. පහත කරුණු වැඩිදුරටත් අනාවරණය විය.

(අ) ආයතනයේ ජංගම වත්කම් හා වගකීම් අතර අනුපාතය සමාලෝචිත වර්ෂයේ සහ ඉකුත් වර්ෂයේ පිළිවෙලින් 0.88 හා 0.61 ක අගයක් ගැණුනි.

(ආ) ආයතනයේ සමුච්චිත අරමුදල අඛණ්ඩව සෘණ අගයන් පෙන්වන අතර 2008 වසරේ සිට 2010 වසර දක්වා එහි සෘණ ශේෂයන් පිළිවෙලින් රු.63,440,426 ක් රු.62,016,683 ක් සහ රු.62,815,644 ක් විය.

### 2.2 මෙහෙයුම් සමාලෝචනය

#### 2.2.1 කාර්ය සාධනය

I. පුහුණු පාඨමාලා පැවැත්වීම

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) 2008 වර්ෂයේ සිට 2010 වර්ෂය දක්වා පාඨමාලා පැවැත්වීමේ සිසු සහභාගීත්ව ප්‍රගතිය, පාඨමාලා ආදායම සහ උපදේශන ගාස්තු වියදම පහත පරිදි විය.

| පාඨමාලාව | සහභාගී වූ සිසුන් සංඛ්‍යාව 2008 | 2009 | 2010 |
|---|---|---|---|
| ස්වර්ණාභරණ මෝස්තර නිර්මාණය | 40 | 13 | 30 |
| ස්වර්ණාභරණ නිෂ්පාදනය | 53 | 50 | 18 |
| ආභරණ සඳහා ගල්බැඳීම | - | 06 | 07 |
| රත්න විද්‍යාව | 91 | 28 | 38 |
| මැණික් කැපීම හා ඔපදැමීම | 188 | 41 | 55 |
| ගෙවුඩ තාප පිරියම් කිරීම | 65 | 16 | 36 |
| මැණික් වර්ණ ශ්‍රේණිගත කිරීම සහ අලෙවිකරණය | 26 | 08 | 45 |
| | ---- | ----- | ----- |
| එකතුව | 463 | 162 | 229 |
| | රු. | රු. | රු. |
| පාඨමාලා ආදායම | 5,597,000 | 2,614,000 | 2,397,000 |
| උපදේශන ගාස්තු | 5,948,378 | 4,441,632 | 3,968,717 |

I. 2009 හා 2010 වර්ෂවලදී උපදේශන වියදමවත් ආවරණය කිරීමට ප්‍රමාණවත් ආදායමක් ලැබී නොතිබුණි. 2008 වර්ෂයට සාපේක්ෂව 2009 හා 2010 වර්ෂවලදී ආදායමේ අඩුවීම පිළිවෙලින් 53% ක් 57% ක අගයක් ගැනුණි.

II. 2008 වර්ෂයට සාපේක්ෂව 2009 හා 2010 වර්ෂවල පුහුණුවීම් සඳහා සිසු සහභාගීත්වය පිළිවෙලින් 65% ක් හා 50% ක පිරිහීමක් නිරීක්ෂණය විය.

III. සමාලෝචිත වර්ෂයේදී පාඨමාලා 06 ක් සඳහා සිසුන් 375 ක් පුහුණු කිරීමට ඇස්තමේන්තු කර තිබුණු අතර සිසුන් 229 ක් එනම් ඇස්තමේන්තු අගයෙන් 61% ක් පමණක් පුහුණු කර තිබුණි.

IV. 2010 ක්‍රියාකාර සැලැස්ම අනුව 2010 වර්ෂය තුළදී පුහුණු මධ්‍යස්ථාන 4 ක් උතුරු හා නැගෙනහිර ප්‍රදේශවල පිහිටුවීමට ඉලක්ක කර තිබු නමුත් එක් මධ්‍යස්ථානයක් පමණක් පිහිටුවා තිබු අතර එහිද පුහුණු පාඨමාලා ආරම්භ කර නොතිබුණි.

V. වරකාපොල පුහුණු මධ්‍යස්ථානයේ මැණික් කැපීම හා ඔපදැමීම සහ ස්වර්ණාභරණ පාඨමාලා පැවැත්වීමට ඉලක්ක කර තිබු නමුත් කිසිදු පාඨමාලාවක් පවත්වා නොතිබුණි.

VI. පුහුණු ඒකක ස්ථාපනය කර ඇතත් 2010 වර්ෂයේදී පැවැත්විය යුතු පාඨමාලා පවත්වා නොතිබුණි.

(ආ) 1995 ජුලි 28 දිනැති අංක 882 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය මගින් මෙම ආයතනයට පැවරී ඇති බලතල 3 යටතේ පතල් කැණීම්, ස්වර්ණාභරණ සෑදීම, මැණික් ගල් පිලිසැසීම සඳහා ක්‍රම සහ ස්වර්ණාභරණ තැනීම වැනි ක්ෂේත්‍රයන්හි මැණික් හා ස්වර්ණාභරණ කර්මාන්තය සංවර්ධනය කිරීම සඳහා යන්ත්‍ර සූත්‍ර නිපදවීම ඇතුළත් ශිල්පීය සහ අනෙකුත් උපදෙස් සැපයීමත් බලතල 5 යටතේ වැඩමුළු , සම්මන්ත්‍රණ පැවැත්වීම සහ අදාළ මාතෘකා හා කරන ලද වැඩකටයුතු ආදිය පිළිබඳ පත්‍රිකා හා පොත්පත් පල කිරීම සිදුකළ යුතු වුවත් ආයතනය විසින් එකී බලතල ක්‍රියාත්මක කිරීමට කටයුතු කර නොතිබුණි.

( ii ) <u>මැණික් නිධි ගවේශණය හා තක්සේරු කිරීමේ ව්‍යාපෘතිය</u>

1995 ජුලි 28 දිනැති ගැසට් නිවේදනය 05 ජේදයේ මෙම ආයතනයට පැවරී ඇති බලතලවල ශ්‍රී ලංකාවේ මැණික් හා ඛණිජ සමීක්ෂණ හා පර්යේෂණ කිරීම ප්‍රධාන කාර්යයන්ගෙන් එකක් ලෙස දක්වා තිබුණි. මේ සඳහා රසායනාගාර පහසුකම් හා අනුමත කාර්ය මණ්ඩලය සකස්කර තිබියදීත්, 2007 සිට 2010 දක්වා වසර 4 ක ව්‍යාපෘතියක් ආරම්භ කිරීමට රු.මිලියන 36 ක ප්‍රතිපාදන අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කර තිබුණි.

මේ සම්බන්ධයෙන් පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) 2007 වර්ෂයේ සිට මෙම ව්‍යාපෘතිය සඳහා ප්‍රතිපාදන වෙන්කර තිබුණද, ඒ ඒ වර්ෂවල වැය කර ඇති ප්‍රතිශතය පහත පරිදි විය.

| වර්ෂය | ඇස්තමේන්තුගත වියදම | තත්‍ය වියදම | මුළු වියදම ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|
| | රු. | රු. | % |
| 2007 | 9,000,000 | 186,044 | 2.06 |
| 2008 | 9,000,000 | 273,188 | 3 |
| 2009 | 9,000,000 | 270,471 | 3 |
| 2010 | 9,000,000 | 1,286,453 | 14 |

(ආ) 2007 වර්ෂයේ සිට 2010 වර්ෂය දක්වා ව්‍යාපෘතියේ තත්‍ය වියදම රු.2,016,156 ක් වූ අතර ඒ පිළිබඳ වියදම් විශ්ලේෂණය පහත පරිදි විය.

| වර්ෂය | වැටුප් හා අතිකාල | ක්ෂේත්‍ර පරීක්ෂණ වියදම් | සිතියම් මිලදී ගැනීම | භූ විදුම් යන්ත්‍රය ප්‍රදර්ශන වියදම් | වෙනත් | එකතුව |
|---|---|---|---|---|---|---|
| ----------- | ----------- | -------------- | ----------- | -------------- | ----------- | ----------- |
| | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| 2007 | - | - | 154,750 | - | 31,294 | 186,044 |
| 2008 | - | 18,185 | 186,000 | - | 69,003 | 273,188 |
| 2009 | 59,105 | 4,100 | - | 107,923 | 99,343 | 270,471 |
| 2010 | 700,269 | 152,625 | 13,362 | 138,668 | 281,529 | 1,286,453 |
| එකතුව | 759,374 | 174,910 | 354,112 | 246,591 | 481,169 | 2,016,156 |
| | ====== | ====== | ====== | ====== | ====== | ======= |
| මුළු වියදමේ ප්‍රතිශතයක් ලෙස | 38% | 8.5% | 17% | 12% | 24% | |

ඒ අනුව මුලික අරමුණ ඉටුකර ගැනීම සඳහා 8% සිට 17% ක පමාණයකින් වියදම් දරා තිබුණි.

(ඇ) කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 33 අනුව දේශීය අරමුදල් යොදාගෙන ව්‍යාපෘතියක් ආරම්භ කිරීමට එහි වටිනාකම රු.මි. 500 ක් ඉක්මවිය යුතුය. නමුත් මෙම ව්‍යාපෘතියේ වටිනාකම රු. මි. 36 කි. කෙසේ වුවද මෙම ව්‍යාපෘතිය සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය මත ආයතනයේ නිලධාරීන් 5 දෙනෙකු පූර්ණ කාලීනවද තවත් නිලධාරීන් 5 දෙනෙකු අර්ධ කාලීනවද යොදාගෙන තිබුණි.

(ඈ) භාණ්ඩාගාර පූර්ව අනුමැතියක් නොමැතිව වාර්ෂික ප්‍රාග්ධන ප්‍රතිපාදනවලින් රු.500,000 ලංකා බැංකුවේ වෙනම ගිණුමක තැන්පත් කර තිබුණි. ජූනි මස මෙම ව්‍යාපෘතියේ කටයුතු නතර කර තිබුණද, මෙම බැංකු ගිණුමෙන් 2010 ජූලි මාසයෙන් පසු රු.78,872 ක් ව්‍යාපෘති වියදම් දරා තිබුණි.

(ඉ) මෙම ව්‍යාපෘතිය සඳහා අවශ්‍ය යන්ත්‍ර , වාහන හා අනිකුත් ද්‍රව්‍ය මිලදී ගැනීම වෙනුවෙන් 2007 වර්ෂයේ සිට 2010 වර්ෂය දක්වා ආයතනයේ මූලධන හා පුනරාවර්තන ප්‍රතිපාදනවලින් රු.15,872,172 ක් ද යොදා ගෙන තිබුණි.

## 2.2.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) ආයතනයේ හිටපු ජ්‍යෙෂ්ඨ කළමනාකරුවෙකු විසින් සිදු කරන ලද රු.2,395,749 ක රන් රිදී තොග වංචාව ඇතුළුව චෝදනා නවයෙන් 6 කට වැරදිකරු වී ඇති අතර අදාළ ඒක පුද්ගල විනිශ්චය සභා වාර්තාව 2010 පෙබරවාරි 05 දින නිකුත් කර තිබුණි. මෙම නිලධාරියාට දඩුවම් පමුණුවීම ආයතන සංග්‍රහය අනුව ක්‍රියාත්මක කළ යුතු බවත්, මූල්‍යමය පාඩු අයකර ගැනීම වෙනුවෙන් ගිණුම් ප්‍රකාශයක් සමඟ පැමිණිල්ලක් නීතිපති දෙපාර්තමේන්තුවේ ගොනු කිරීමටත් කටයුතු කරන ලෙස නීතිපති විසින් 2010 මැයි 17 දින දන්වා එවා තිබුණි. 2011 අප්‍රේල් 26 වනතෙක්ම ඒ අනුව කටයුතු කර නොතිබුණි.

(ආ) මෙම විගණන වාර්තාවේ 2.2.1 ඡේදය ප්‍රකාරව ආයතනයේ කාර්ය සාධනය 2008 වර්ෂයට සාපේක්ෂව 2009 හා 2010 වර්ෂවල පිළිවෙලින් 53% ක් හා 57% ක ආදායමේ පිරිහීමක් සහ පර්යේෂණ කටයුතු ඉතා පහළ අගයක් ගෙන තිබියදීත් ආයතනයේ සභාපතිවරයා විසින් ඉහළ කළමනාකරණයේ වැටුප්, කාර්ය සාධනය පදනම් කර ගනිමින් යයි සඳහන් කරමින් 2008 වර්ෂයට සාපේක්ෂව 24% කින් හා 12% කින් වැඩිකර තිබුණි.

(ඇ) සභාපතිවරයා ආයතනයට වාර්තා කරනු ලබන්නේ සතියකට එක් දිනක් පමණක් නමුත් පූර්ණ කාලීන සභාපතිවරයෙකුට හිමි මාසික දීමනාව සහ ඉන්ධන දීමනා ලබාගෙන තිබුණි. ඒ අනුව ඉකුත් වර්ෂය සඳහා දීමනා එකතුව රු.1,175,141 ක්ද සමාලෝචිත වර්ෂය සඳහා රු.1,200,000 ක්ද ලබාගෙන තිබුණි. සභාපතිවරයා අධීක්ෂණ කටයුතු සඳහා ප්‍රාදේශීය පුහුණු මධ්‍යස්ථානවලට යාමට සිදුවන බව පිළිතුරු වශයෙන් දැනුම්දී ඇත.

## 2.2.3 ආර්ථිකමය නොවූ ගණුදෙනු

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) ආරක්ෂක සේවා ලබාගැනීම සඳහා 2005 ඔක්තෝබර් 04 දින පෞද්ගලික ආයතනයක් සමඟ එළඹි ගිවිසුම අනුව ආයතනය සඳහා ජ්‍යෙෂ්ඨ ආරක්ෂක නිලධාරීන් දෙදෙනෙකු (දිවා රාත්‍රී පැය 12 සේවා මුර සඳහා) ලබාගැනීමට එකඟතාවයකට පත්වී තිබුණි. 2005 වසරේ සිට 2010 වසර දක්වාම මෙම ආයතනයේ සේවාව ලබාගෙන ඇති නමුත් ගිවිසුම් අළුත් කිරීමක් හෝ සිදුකර නොතිබුණි. රත්නපුර කාර්යාලයේ ආරක්ෂක නිලධාරීනගේ පැමිණීමේ ලේඛනය අනුව ආරක්ෂක නිලධාරීන් දෙදෙනෙකු විසින් සේවය සපයා ඇති බව නිරීක්ෂණය වූ අතර අදාළ ගෙවීම් සිදුකිරීමේදී නිලධාරීන් 3 දෙනෙකු සඳහා ගෙවීම් සිදුකර තිබුණි. සේවා අංක රහිත පැමිණීමේ වාර්තා නොමැති පුද්ගලයෙකු සඳහා 2008 ජූලි 15 දින සිට 2010 දෙසැම්බර් 31 දින දක්වා රු.559,911 ක් ගෙවා තිබුණි.

(ආ) කොළඹ පුහුණු මධ්‍යස්ථානයේ කාර්යාල කාර්ය සහායකයකුගේ කාර්යයන් ඉටු කිරීම සඳහා සේවා අංක රහිත ආරක්ෂක ඇඳුමින් සැරසී නොසිටින ලද ආරක්ෂක නිලධාරියෙකුට 2009 වර්ෂය සඳහා රු.160,916 ක් ද 2010 වර්ෂය සඳහා රු.241,500 ක් ද වශයෙන් එකතුව රු.402,416 ක් ගෙවා තිබුණි.

2.2.4 **අධිකාර් බලයෙන් තොර ගණුදෙනු**

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතියකින් තොරව ආයතනයේ සභාපතිවරයා විසින් 2009 මැයි 01 සිට බලපැවැත්වෙන පරිදි එච්එම් 1-1 වැටුප් කාණ්ඩයේ 38,530 (1100x15) 55,030 වැටුප් ව්‍යුහයේ රු.50,630 වැටුප් පියවරේ සිටි අධ්‍යක්ෂකවරයා එච්එම්-2-3 වැටුප් කණ්ඩයේ 47,245-(1310x12) 62,965 යන වැටුප් පර්මාණයේ 11 වන වැටුප් වර්ධකය වන රු. 61,655 හි පිහිටුවා තිබුණු අතර ගණකාධිකාරවරයා සහ පර්පාලන හා පිරිස් යන නිලධාරීන් දෙදෙනා එම්එම් 1-1 කාණ්ඩයේ 25,640 (665x3-735x7-925x15) 46,655 වැටුප් ව්‍යුහයේ රු.38,330 වැටුප් පියවරේ සිට එම වැටුප් කණ්ඩයේම 28,370-(735x6-925x15)46,655 වැටුප් පරිමාණයේ වැටුප් වර්ධක 16 ක් ඉදිරියෙන් වු රු.42,030 වෙනි වැටුප් පියවරේ පිහිටුවා තිබුණි. 2009 මැයි 01 සිට 2010 දෙසැම්බර් 31 දක්වා අධිකාර අනුමැතිය නොලත් මුළු ගෙවීම් එකතුව රු.368,500 ක් විය.

(ආ) සභාපතිවරයා විසින් ඔහුගේ විශේෂ විමර්ශන රාජකාර කටයුතු යනුවෙන් සඳහන් කර විමර්ශන නිලධාරියෙකු (ආරක්ෂක නිලධාරියෙකු) සහ රියදුරෙකු යොදවාගෙන තිබු අතර මෙම සේවකයින් දෙදෙනා සේවයට පැමිණීම ආයතනයේ හෝ ශාඛාවල පැමිණීමේ ලේඛනයේ සටහන් කර නොතිබු අතර සභාපති අංශය විසින් නිකුත් කරන වාර්තාවක් පදනම් කරගෙන ඔවුන්ට ගෙවීම් සිදු කර තිබුණි. සමාලෝචිත වර්ෂයේදී විමර්ශන නිලධාර (ආරක්ෂක නිලධාරියෙකු) වශයෙන් රු.235,100 ක් ද රියදුරු සඳහා රු.165,240 ක් ද වශයෙන් එකතුව රු.400,340 ක් ගෙවා තිබුණි.

2.2.5 **ඌන උපයෝජිත වත්කම්**

2007 වර්ෂයේදී රු.12,309,013 ක පිරිවැයක් දරා භූ විදුම් යන්ත්‍රයක් මිළදී ගෙන තිබුණද, 2010 දක්වා මෙම යන්ත්‍රයෙන් නිසි ප්‍රයෝජන ලබාගෙන නොතිබුණි. මෙම යන්ත්‍රය වෙනුවෙන් පෙරහුරු පරීක්ෂණ දෙකක් සඳහා රු.246,591 ක් ද රක්ෂණ ගාස්තු වෙනුවෙන් රු.99,434 ක් ද දරා තිබුණි.

2.2.6 **මානව සම්පත් කළමනාකරණය**

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) **සේවක මණ්ඩල තොරතුරු**

සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට අනුමත සහ තත්‍ය කාර්ය මණ්ඩලය පහත පරිදි නිරීක්ෂණය විය.

| | අනුමත කාර්ය මණ්ඩලය | තත්‍ය සංඛ්‍යාව |
|---|---|---|
| මාණ්ඩලික | 15 | 15 |
| මාණ්ඩලික නොවන | 24 | 15 |
| සුළු සේවක | 18 | 11 |
| කොන්ත්‍රාත් / අනියම් | - | 05 |
| | --- | --- |
| එකතුව | 57 | 46 |

(ආ) සමාලෝචිත වර්ෂය තුළදී විවිධ තනතුරු සඳහා කොන්ත්‍රාත්, අනියම් හා කාර්ය පැවරුම් පදනම මත සේවකයින් බඳවා ගෙන තිබූ අතර ඒ සඳහා රු.595,799 ක් ගෙවා තිබුණි. මෙම පත්වීම් සඳහා අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතියකින්ද තොරව ඒ ඒ තනතුරු සඳහා අදාළ සුදුසුකම් පරීක්ෂාවකින්ද තොරව ආයතනයේ සභාපතිවරයා විසින් පත්කිරීම් සිදු කර තිබුණි.

(ඇ) 2010 මැයි 18 දිනැති පරිසර අමාත්‍යාංශයේ අංක 02/04/04/29 1 දරන අතිරේක ලේකම්ගේ ලිපිය අනව සියළු බඳවා ගැනීම් හා උසස් කිරීම් වහාම ක්‍රියාත්මක වන පරිදි අත්හිටුවන බව දන්වා තිබියදීත් ආයතනයේ අනුමත සේවක සංඛ්‍යාව ඉක්මවා ස්ථිර සේවක සංඛ්‍යාවක්ද සිටියදී (පුරප්පාඩු නොමැතිව) රියදුරු, බාහිර කළමනාකරණ සහායක සහ බාහිර පුහුණු ප්‍රවර්ධන තනතුරු සඳහා බඳවා ගැනීම් 3 ක් සිදු කර තිබුණි.

(ඈ) ආයතනයේ සභාපතිවරයා විසින් අධ්‍යක්ෂ මණ්ඩලයේද අනුමැතියකින් තොරව උසස්වීම් ලබාදුන් අවස්ථා 4 ක් නිරීක්ෂණය වූ අතර එකී උසස් වීම් ලබාදිමේදී ආයතන සංග්‍රහයේ v11 පරිච්ඡේදයේ 5 වගන්තියට පටහැනිව උසස්වීමේ වැටුප තීරණය කර තිබුණි. ඒ අනුව නියමිත වැටුප් තල ඉක්මවා රු.148,407 ක් සේවකයින් 4 දෙනෙකු වෙනුවෙන් ගෙවා තිබුණි.

(ඉ) කළමනාකරණ සහායක නිලධාරිනියක් 2010 අප්‍රේල් 12 දින සිට වැඩසටහන් නිලධාරි තනතුරේ වැඩ බැලීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතියකින්ද තොරව ආයතනයේ සභාපතිවරයා විසින් පත්කර තිබූ අතර ඒ සඳහා අමාත්‍යාංශ ලේකම්ගේ අනුමැතියකින් තොරව වැඩබැලීමේ වැටුප් වශයෙන් රු.35,857 ක් සමාලෝචිත වර්ෂයේදී ගෙවා තිබුණි.

(ඊ) කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ 2007 මැයි 29 දිනැති ඩීඑම්එස්/එ2/ජේආර්ටීඅයි දරන ලිපියෙහි කළමනාකරණ සේවා අංක 30 චක්‍රලේඛයේ විධිවිධාන ක්‍රියාත්මක කිරීමේදී ආයතන සංග්‍රහයේ v11 පරිච්ඡේදයේ 4.3,4.4 හා 4.5 යන උපවගන්ති වලට පටහැනිව යමින් සමස්ථ කාර්ය මණ්ඩලයේම වැටුප් සකසා තිබුණි.

### 2.2.7 <u>අයවැය පාලනය</u>

ඇස්තමේන්තුගත හා තත්‍ය ආදායම් හා වියදම් අතර 4% සිට 100% දක්වා වූ සැලකිය යුතු විචලනයන් වුයෙන් අයවැය ලේඛනය ඵලදායි කළමනාකරණ පාලන කාරකයක් ලෙස යොදාගෙන නොතිබුණු බව නිරීක්ෂණය විය.

## 03. <u>පද්ධති හා පාලන</u>

විගණනයේදී නිරීක්ෂණය වු ක්‍රියා පද්ධතීන් හා පාලන අඩුපාඩු සභාපතිවරයාගේ අවධානයට යොමු කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් සම්බන්ධයෙන් අවධානය යොමුකළ යුතුවේ.

(අ) පර්යේෂණ කටයුතු

(ආ) පාඨමාලා පැවැත්වීම

(ඇ) සේවක බඳවාගැනීම් සහ උසස්වීම්

(ඈ) භාණ්ඩ සමීක්ෂණය

(ඉ) ආරක්ෂක සේවා සැපයීම

(ඊ) ඉන්ධන වියදම්